Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## Provincial Department of Education - NWP

### දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
### Second Term Test - Grade 07 - 2023

## බුද්ධ ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

සැලකිය යුතුය,

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 2 බැගින් හිමි වේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.

---

- අංක 01 සිට 05 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. බුදුරජාණන් වහන්සේ තම මංගල ධර්ම දේශනය සිදු කළේ,
   1. ආලාරකාලාම තවුසාටය.
   2. පස්වග මහනුන්ටය.
   3. භග්ගව තවුසාටය.
   4. උද්දිකරාමපුත්ත තවුසාටය.

02. උපතිස්ස කෝලිත පිරිවැජියන් දෙදෙනා සමඟ බුදු සසුනේ පැවිදි වූ පිරිස,
   1. 250 කි.
   2. 1003 කි.
   3. 300 කි.
   4. 500 කි.

3. බුදු සසුනේ අග්‍රදායකයා හා අග්‍රදායිකාව වන්නේ,
   1. අනේපිඩු සිටුතුමා හා සුජාතාවයි.
   2. අනේපිඩු සිටුතුමා හා විශාඛාවයි
   3. බිම්බිසාර රජු හා විශාඛාවයි.
   4. අනේපිඩු සිටුතුමා හා සුජාතාවයි.

4. බුදුරජාණන් වහන්සේ විසින් සිඟාලක ගෘහපතියාට දේශනා කළ සූත්‍රය වන්නේ,
   1. මහා නිදාන සූත්‍රයයි.
   2. රතන සූත්‍රයයි.
   2. කරණීයමෙත්ත සූත්‍රයයි.
   4. සිඟාලෝවාද සූත්‍රයයි.

5 ධම්ම සේනාපති තනතුරින් පිදුම් ලැබූ මහ රහතන් වන්නේ,
   1. සැරියුත් මහරහතන් වහන්සේ,
   2. ආනන්ද මහරහතන් වහන්සේ,
   2. කාශ්‍යප මහරහතන් වහන්සේ,
   4. මුගලන් මහරහතන් වහන්සේ,

- අංක 06 සිට 10 දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර B තීරුවෙන් තෝරා එහි අංකය A තීරුවෙහි තිබෙන වරහනෙහි යොදන්න.

| A | | B |
|---|---|---|
| 06. දෙවියන්ට පුදන කොටස | ( ) | 1. ජේතවනාරාමය |
| 07. බිම්බිසාර රජු | ( ) | 2. අක්කියාල |
| 08. අලුත් බත් දානය | ( ) | 3. පූර්වාරාමය |
| 09. අනන්තලක්ඛණ සූත්‍රය | ( ) | 4. අග්‍රශෂ්‍ය දානය |
| 10. විශාඛා උපාසිකාව | ( ) | 5. පස්වග තවුසන් |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- 11 සිට 15 දක්වා වූ ප්‍රශ්නවලට හරි නම් (√) ලකුණ ද වැරදි නම් ( X ) ලකුණ ද යොදන්න.

11. බුදුරජාණන් වහන්සේ දෙව් මිනිසුන්ගේ ශාස්තෘ වූ හෙයින් සත්ථා දේවමනුස්සානන් වූ සේක. ( )
12. උපස්ථායකයකු තුළ තිබිය යුතු ගුණාංග 5 කි. ( )
13 සිඟාලෝවාද සූත්‍රය තුන් සූත්‍රයට අයත් එකකි. ( )
14. වෛරය වෛරයෙන් නොසන්සිඳේ. ( )
15. උපයන ධනය සමාජ යුතුකම් වෙනුවෙන් වැය කළ යුතු බව දක්වා ඇත්තේ පත්තකම්බ සූත්‍රයෙ ය. ( )

- අංක 16 සිට 20 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

16. සෝවන් වූ පළමු රජතුමා.......................................................... රජතුමාය.
17. .................................................දී මහා සුළඟක් සමඟ වර්ෂාවක් ඇති වීම හා එම වර්ෂාවෙන් බුදු රදුන් ආරක්ෂා කිරීමට මුචලින්ද නා රජු ඉදිරිපත් විය.
18 මෛත්‍රිය වැඩිය යුතු ආකාරය මැනවින් විස්තර කෙරෙන දේශනාවකි .................................................. ය
19. අප බෝධි සත්වයන් වහන්සේ බුද්ධත්වයට පත් වූයේ .............................................පෝය දිනයේදී ය.
20. උපතිස්ස කෝලිත ..........................................පිරිවැජියාගේ ගෝලයන් ය.

(සංජය/බිම්බිසාර/ වෙසක්/පොසොන්/හයවන සතිය/කරණීයමෙත්ත)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 5කටපිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් ද 2 සිට 7 දක්වා ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් ද හිමි වේ.

01 කෙටි පිළිතුරු සපයන්න.

i. බුදුරජාණන් වහන්සේට බුද්ධත්වයෙන් පසු ලෝක සත්වයාට දහම් දේශනා කරන ලෙස ආරාධනා කළේ කවුද ?

ii. පළමු ද්වේවාචික උපාසකවරුන්ගේ නම් ලියන්න.

iii. බුදුන් වහන්සේ අසරණයන්ට පිහිට වුණ අවස්ථා 2 ක් ලියන්න.

iii. රහසින්වත් පව් නොකොට
කෙලෙසරයනුත් දුරු කොට
..............................................................
..............................................................ඉතිරි පද 2ක සම්පූර්ණ කරන්න.

v. සිරිත් හා විරිත් යන්නෙහි අර්ථය ලියන්න.

vi. සිඟාලෝවාද සූත්‍රය අනුව දකුණු දිශාවෙන් නියෝජනය කරන්නේ කුමන සමාජ කොට්ඨාසය ද ?

vii. මහින්දාගමනයෙන් පසු අපේ ජනසමාජයට එක් වූ උතුම් ගුණාංග 2 ක් ලියන්න.

viii වචනයෙන් සිදුවන වැරදි 2ක් ලියන්න.

ix. බුදු සසුනේ අග්‍රශ්‍රාවකයන්ගේ නම් ලියන්න.

x. බිම්බිසාර රජතුමා සහ අනේපිඬු සිටිතුමා විසින් සාදන ලද ආරාම 2ක් ලියන්න.

02. i. බුදුරජාණන් වහන්සේ ගිලනුන්ට උපස්ථාන කළ අවස්ථා 2ක් ලියන්න.

ii. ඉන් එක් අවස්ථවක් කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. උපස්ථායකයකු තුළ තිබිය යුතු ගුණාංග 5 ක් ලියන්න.

3. i. සිරිත් මල්දම කෘතිය රචනා කරන ලද කර්තෘන්ගේ නම් ලියන්න.

ii. පාසලේ දී ඔබ අනුගමනය කරන සිරිත් විරිත් 03ක් ලියන්න.

iii. ආදර්ශවත් බොදු දරුවෙකු ලෙස පන්සලේ දී ඔබ අනුගමනය කළ යුතු සිරිත් විරිත් 05ක් ලියන්න.

4. i. නායකයා ඥානවන්ත ව කටයුතු කිරීමෙන් සමෘද්ධියට පත් වූ වෙළඳ කණ්ඩායමක් ගැන කියවෙන ජාතක කතාව කුමක් ද?

ii. එම ජාතක කථාවෙක් ගත හැකි ආදර්ශ 03ක් ලියන්න.

iii. ආදර්ශවත් නායකයෙකු ලෙස පන්ති කාමරයේ දී ඔබ කටයුතු කරන ආකාරය වාක්‍ය 05කින් ලියන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

05. i. “ගුරුසිත නොරිදවා .................” යන කවිය සම්පූර්ණ කරන්න.

ii. ගුරුවරුන් විසින් සිසුන් වෙනුවෙන් සිදු කරන යුතුකම් 03ක් ලියන්න.

iii. ගුරුවරුන් හා සිසුන් අතර මනා අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පවත්වා ගෙන යාම සඳහා සිසුන් විසින් ගුරුවරුන්ට ඉටු කළ යුතු යුතුකම් 05ක් ලියන්න.

06. i. භාවනාවේ දී කාන්තාවන් හා පිරිමින් භාවිත කරන නිවැරදි ඉරියව් 02ක් ලියන්න.

ii. කරණීයමෙත්ත සූත්‍රයෙහි මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග 15ක් සඳහන් වේ. ඉන් 03ක් ලියන්න.

iii. මෛත්‍රී භාවනාවෙන් ලැබෙන ආනිශංස 05ක් ලියන්න.

07 i. බුදුරජාණන් වහන්සේ මංගල ධර්ම දේශනය පැවැත්වූයේ කොතනදී ද?

ii. පළමු රහතන් වහන්සේ 60 නම සකස් වූ අයුරු කෙටියෙන් විස්තර කරන්න.

iii. බුදුරජාණන් වහන්සේ මගධයට වැඩම කිරීමෙන් පසු මගධාධිපති බිම්බිසාර රජුගේ බලාපොරොත්ත 05ක් ඉටු විය. ඒවා මොනවා ද?

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 07 - 2023

# බුද්ධ ධර්මය

පිළිතුරු පත්‍රය

## I කොටස

(1) 2
(2) 1
(3) 3
(4) 4
(5) 1
(6) (2)
(7) (1)
(8) (4)
(9) (5)
(10) (3)
(11) √
(12) √
(13) ×
(15) ×
(14) √
(16) බිම්බිසාර
(17) හයවන සතියේ
(18) කරණීයමෙත්ත
(19) වෙසක්
(20) සංජය

## II කොටස

**01.**

I. සහම්පති බ්‍රහ්මයා
II. තපස්සු,භල්ලුක
III. අසරණ මහලු පියෙක් / වරදට හසු වූ ගොවියා / සෝපාක / පටාචාරා
IV. නිසි වූයෙන් පුදට
අරහ යැයි නම කියති මුනිඳුට
V. කළ යුතු දේ , නොකළ යුතු දේ
VI. ගුරු සිසු

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

VII. වැඩිහිටියන්ට සැළකීම , පරෝපකාරය , කළ ගුණ සැළකීම
VIII. බොරු කීම / කේලාම් කීම / පරුෂ වචන කීම / සම්ප්‍රප්පලාප කීම
IX. ඛුද්දක නිකාය
X. වේළුවනාරාමය , ජේතවනාරාමය

(2×10 = 20)

02.

I. පූතිගත්ත තිස්ස තෙරුන්
උදරාබාධයකින් පෙලුන භික්ෂුව
II. මින් එක් අවස්ථාවක් පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.
III. 16 පිටුව

(2+3+5 = 10)

03.

I. එම්.එල් ගුරු මුහන්දිරම් තුමා.
II. 30 පිටුව
III. 31,32 පිටු

(2+3+5 = 10)

04.

I. අපණ්ණක ජාතක කථාව
II. 83 පිටුව
III. ශිෂ්‍යා ලියා ඇති පිළිතුර සලකා බල ලකුණු ලබා දෙන්න.

(2+3+5 = 10)

05.

I. වේලාව නොවරදවා
බැති පෙම් උපදවා
අකුරු උගනී කුමරු සොඳවා
II. 73 ප්ටුව
III. 75 පිටුව

(2+3+5 = 10)

06.

I. බද්ධ පර්යංකය
අර්ධ පර්යංකය
II. 35 පිටුව
III. 39 පිටුව

(2+3+5 = 10)

07.

I. බරණැස ඉසිපතනයේ මිගදාය
II.

| | | |
|---|---|---|
| පස්වග මහණුන් | = | 5 |
| යසකුල පුත්‍රයා | = | 1 |
| යහළුවන් | = | 54 |
| එකතුව | = | 60 |

III. තමා මගධයේ රජ වීම.
තම රටට බුදු රදුන් වැඩම කරවා ගැනීම.
බුදු රදුන් ඇසුරු කිරීම.
උන් වහන්සේගෙන් බණ ඇසීම.
එම ධර්මය අවබෝධ කර ගැනීම.

(2+3+5 = 10)